ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය කොළඹ
මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: chulickna@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160406

**විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් සහ නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් මැන්ප්‍රීට් ආනන්ද් ශ්‍රී ලංකාවේ සංචාරය කරයි**

2016 අප්‍රියෙල් 06- එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වොල්ඩ් මහතා සහ එක්සත් ජනපදයේ දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් මැන්ප්‍රීට් ආනන්ද් ශ්‍රී ලංකාවේ දින ගණනාවක සංචාරයක් සාර්ථකව නිමාකරන ලදී. මෙම සංචාරය අතරතුරදී ඔවුහු සංහිඳියාව පිළිබඳ රජයේ හා දේශපාලන නායකයින් ගේ සහ දිවයිනේ විවිධ ප්‍රදේශ වල සිවිල් සමාජ ආයතන වල අදහස් වලට සවන් යොමු කළහ.

“ශ්‍රී ලාංකික ජනතාව ව්‍යාවස්ථාමය ප්‍රතිසංස්කරණ සහ සාමකාමී සෞභාග්‍යමත් සහ සංහිඳියාවෙන් යුත් අනාගතයක් කරා එලැඹීමේ මෙම වැදගත් අවස්ථාවේදී එක්සත් ජනපදය ඔවුන්ට සහාය දක්වීමට අපේක්ෂා කරනවා. ඉදිරි වර්ෂ වලදී එක්සත් ජනපද රජය ශ්‍රී ලංකාවට ලබාදෙන සහයෝගය සහ ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රතිපත්තීන් සැකසීම සඳහා මෙම අමුත්තන් දෙපළ සහාය දක්වන බැවින් ශ්‍රී ලංකාවේ විවිධ පුද්ගලයින් විසින් සංහිඳියාව පිළිබඳව දක්වන අදහස් වලට සවන්දීම ඔවුන්ට ඉතා වැදගත්වෙනවා” යනුවෙන් එක්සත් ජනපද තානාපති අතුල් කෙශාප් පැවසීය.

සංහිඳියා ක්‍රියාවලියේ මේ දක්වා අත්කරගෙන තිබෙන ප්‍රගතිය අවබෝධ කරගැනීම සඳහා තානාපති අතුල් කෙශාප් සහ බච්වෝල්ඩ් මහතා විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා සහ උතුරු පළාත් ආණ්ඩුකාර රෙජිනෝල්ඩ් කුරේ හමුවිණි. ඉන් අනතුරුව බච්වෝල්ඩ් මහතා විපක්ෂනායක ආර් සම්බන්දන් මහතාද හමුවූ අතර මෙහිදී ඔහු විසින් යුද්ධයෙන් බලපෑමට ලක්වූ ජනතාව මුහුණ දෙන ගැටලු පිළිබඳව ගණනාවක් පෙන්වා දෙන ලදී. සංහිඳියා ක්‍රියාවලිය මුහුණු පාන අභියෝගයන් සහ උතුරු පළාතේ ජීවනෝපාය මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට තානාපති තුමා, බච්වෝල්ඩ් මහතා සහ නියෝජ්‍ය සහකාර ලේකම් උතුරු පළාතේ මහ ඇමති සී. වී විග්නේශ්වරන් මහතා හමුවිණි. බච්වෝල්ඩ් මහතා නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ඔස්ටින් ප්‍රනාන්දු මහතා හමුවී සුහද සාකච්ඡාවක් පැවැත්වීය.

බච්වෝල්ඩ් මහතා සහ නියෝජ්‍ය සහකාර ලේකම් ආනන්ද් මහනුවර ප්‍රදේශයේ සංචාරය කළ අතර මෙහිදී ඔවුන් තරුණයින් සහ සිවිල් සංවිධාන නායකයින් හමුවී සාකච්ඡා කරනු ලැබූහ. ඒ අතර ඔවුහු දළදා මාළිගාවට ගොස් තම ගෞරවය පුදකළහ. මීට අමතරව බච්වෝල්ඩ් මහතා ත්‍රිකුණාමළය සහ යාපනයට ගොස් ආගමික කණ්ඩායම්, පළාත් පාලන නියෝජිතයින්, ශිෂ්‍යයින් සහ සිවිල් සංවිධාන හමුවී සංහිඳියාව පිළිබඳ සාකච්ඡා පැවැත්වීය .

“ශ්‍රී ලංකාවේ අදපවත්නා තත්වය පිළිබඳව විවිධ වූ පුද්ගලයින්ගේ නොයෙකුත් අදහස් දැනගැනීමට හැකිවීම ඉතා ප්‍රයෝජනවත් වුණා. අපිට ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශ වලට ගොස් දැනට ලබාගන ඇති ප්‍රගතිය සහ තවමත් පවතින අභියෝගයන් පිළිබඳව සෘජුවම ජනතාව හමුවී ඉක්මනින් තොරතුරු ලබාගැනීමට මෙහිදී අවස්ථාව ලැබුණා” යැයි බච්වොල්ඩ් මහතා පැවසීය.

**ඡායාරූප උදෘතය** 1 එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් මහතා සහ එක්සත් ජනපදයේ දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් මැන්ප්‍රීට් මහතා සහ එක්සත් ජනපච තානාපති අතුල් කෙශාප් උතුරු පළාතේ මහ ඇමැති සී . වී විග්නේශ්වරන් මහතා සමග සංහිඳියාව සහ උතුරු පළාගේ ජීවනෝපාය මාර්ග සම්බන්ධයෙන් පවක්නා අභියේගයනි පිළිබඳ සාකච්ඡා පැවැත්වීය

**ඡායාරූප උදෘතය** 2 එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් මහතා සහ එක්සත් ජනපදයේ දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ සහකාර ලේකම් මැන්ප්‍රීට් ආනන්ද් මහනුවර ඇමෙරිකානු මධ්‍යස්ථානයේදී තරුණයින් සමග සාකච්ඡා පැවැත්වීය

**ඡායාරූප උදෘතය** 3 එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් මහතා සහ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධානී ඇන්ඩ්‍රිව් මැන් මහතා ත්‍රිකුණාමලයේදී නැගෙනහිර පළාත් ආන්ඩුකාර ඔම්ටින් ප්‍රනාන්දු හමුවූ අවස්ථාව

**ඡායාරූප උදෘතය** 4 එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් මහතා උතුරේ තරුණයින් සහ සිවිල් සමාජ කණ්ඩායම් හමුවී සාකච්ඡා පැවැත්වීය

**ඡායාරූප උදෘතය** 5 - එක්සත් ජනපදයේ ජගත් අපරාධ යුක්තිය පිලිබඳ කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක ටොඩ් බච්වෝල්ඩ් මහතා විපක්ෂනායක ආර් සම්බන්දන් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී එම් ඒ සුමන්තිරන් මහතා හමුවී සාකච්ඡා පවත්වයි